IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්
2017

# மனிதவள மேம்பாட்டு நிறுவகம்
கொழும்புப் பல்கலைக்கழகம், ஸ்ரீலங்கா

ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்
2017

# INSTITUTE OF HUMAN RESOURCE ADVANCEMENT
*University of Colombo,* Sri Lanka

**ANNUAL REPORT AND ANNUAL ACCOUNTS**
**2017**

# මානව සම්පත් අභිවර්ධන ආයතනය (මා.ස.අ.ආ.)
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව - 2017

## දැක්ම

*අභියෝගාත්මක ගෝලීය තත්ත්වයනට මුහුණ දිය හැකි සහ අපගේ ජාතික සංවර්ධනයේ මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත සහ බුද්ධිමත් “දැනුම-භාවිතකරන්නන්” ලෙසින් මානව සම්පත අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇප කැප වූ ඉහළම තත්ත්වයේ පිළිගත් ආයතනයක් බවට පත්වීම.*

## මෙහෙවර

*“උපයමින් ඉගෙනීම” කරන සේව්‍ය, සේවක සහ ව්‍යවසායක වූ සේවා-කාණ්ඩ සඳහා තම හැකියාවන් ඉහළ නැංවීමට පූර්ණ තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ ඉහළ මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට පහසුකම් සපයමින් මග පෙන්වීම.*

*ඔවුන්ගේ විචාරාත්මක සහ තර්කානුකූලව සිතීමේ හැකියාව, ආචාරධර්ම, ප්‍රමිතීන්, ව්‍යවසාය දක්ෂතා, නායකත්ව ලක්ෂණ සහ යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බව අවබෝධ කොට ගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය කර ගැනීමට තව දුරටත් මග පෙන්වීම.*

*දේශයේ “දැනුම්-ආර්ථිකය” සඳහා බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක් දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස පෙළ ගැසුණු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට කැපවීම.*

## වටිනාකම්

- *නවෝත්පාදන සංවිධානය*
- *ඉලක්ක සපුරා ගැනීමට කැපවීම*
- *විෂය අන්තර්ගතයන්හි විවිධත්වය*
- *පර්යේෂණ සහ සංවර්ධන සංස්කෘතිය*
- *විශ්වසනීයත්වය*
- *වගකීම සහ වගවීම*
- *සාමග්‍රිය*
- *සමාන අවස්ථා*

## අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



*'අපගේ සමාජය ප්‍රගතියට හා ඉදිරියට යා යුතු බව අපි විශ්වාස කරමු. එමෙන්ම ප්‍රගතිය ක්‍රමානුකූලව දිගින් දිගටම පවත්වා ගැනීමට අපි උත්සහ කරන්නෙමු. එම ප්‍රගතිය අපගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලනික අභිලාෂයන් සාකල්‍යව වැළඳ ගැනීම අපි ඉලක්ක කරමු. ප්‍රගතිශීලි සමාජයක් යනු එහි ජීවත් වන ජනතාවගේ සමාජ, සංස්කෘතික සහ දේශපාලන අභිලාෂයන් යථාර්ථයක් බවට පත් කරන්නා වූ සංසදයක් බව අපි විශ්වාස කරන්නෙමු.'*

2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මම මහත් භාග්‍යයක් කොට සලකමි. මෙම කාල වකවානුවේදීත් සහතික මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා විවිධාකාර ශික්‍ෂණයන්ගෙන් යුත් විෂය පථ පුළුල් පරාසයක ඉගෙනුම් සම්පාදනය කරන්නා වූ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් නොකඩවා ජාතියට සේවා සම්පාදනය කෙරිණ. මෙම වර්ෂයේදී සැලකිය යුතු විශේෂතම කාරණයක් වන්නේ ශාස්ත්‍රීය කමිටුවේ මග පෙන්වීම යටතේ ආයතනයේ අධ්‍යයන වැඩසටහන් මෙන්ම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට මූලික පියවර ගැනීමයි.

2017 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අඛණ්ඩ වර්ධනය පෙන්නුම් කරනු ලබන කැපී පෙනෙන ජයග්‍රහණ කිහිපයක් ළඟා කර ගැනීමට හැකිවිය. ප්‍රධාන වශයෙන් ආයතන නියමාවලිය සංශෝධනය කොට උසස් උපාධි ඇතුළු උපාධි පිරිනැමීමට අනුමැතිය ලබා ගැනීමට හැකිවීම දැක්විය හැක. දෙවනුව ආයතනික පශ්චාත් උපාධි විෂය මාලාවන් ඇතුළු අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසි සංශෝධනය කොට පාලක සභාවේද අනුමැතිය ලබා ගැනීමට හැකිවීමද වැදගත් වේ. එපමණක් නොව, පශ්චාත් උපාධි සහ පර්යේෂණ අධ්‍යයන මණ්ඩලය සහ ප්‍රථම උපාධි අධ්‍යයන මණ්ඩලය ලෙසින් අධ්‍යයන මණ්ඩල පිහිටුවීම මගින් අධ්‍යයන මණ්ඩලද වෙනස් කිරීමට මෙම වසර තුළ හැකියාව ලැබිණ. තෙවනුව දීර්ඝ කාලයක් පුරා අවශ්‍යතාවයක්ව පැවති ආයතන මානව සම්පත වැඩිකර ගනිමින් අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයින් රැසක් සේවයට අනුයුක්ත කර ගැනීමට මෙම වසරේදී ආයතනයට හැකියාව ලැබුණි. අවසාන වශයෙන් භෞතික අවකාශය පුළුල් කිරීමට සහ භෞතික අවකාශය භාවිත කිරීම් වඩාත් ප්‍රායෝගික ක්‍රමවේදයකටත් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ වූ මූලාරම්භයන් සිදු කිරීමට හැකියාව ලැබීම දැක්විය හැක.

2017 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රමුඛතම වැඩසටහන වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සඳහා නවක විද්‍යාර්ථීන් 184 ක් ලියාපදිංචි වූ අතර එම වැඩසටහන තුළ අධ්‍යාපනය ලැබූ සමස්ත විද්‍යාර්ථීන් සංඛ්‍යාව 537 කි. ආසන්න වශයෙන් 542 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම හෝ වෘත්තික මට්ටමේ විද්‍යාර්ථීන් පිරිසක් පශ්චාත් උපාධි පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතුවල නිරත වූ අතර එම අධ්‍යයන වැඩසටහන් නම්: ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව සහ භූතොරතුරු විද්‍යාපති පාඨමාලාව වේ.

2017 වර්ෂයේදී තමන් සතු විෂයානුබද්ධ දැනුම පුළුල් කර ගැනීම සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතුවල නියුක්ත වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 295 ක් වන අතර ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ 2,537 ක් සහතික පත්‍ර පාඨමාලා සඳහා පසුගිය වසර තුළ ලියාපදිංචි වූහ. 2017 වසර තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් වෘත්තිමය රාමුව තුළ දැනුම වර්ධනය උදෙසා පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව 13 ක් වන අතර ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ 907 ක් එම වැඩමුළු සඳහා සහභාගි වූහ.

දිගු ඉතිහාසයක් ඇති කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අපි, ප්‍රගතිශීලි සමාජයක ජීවත් වන ජනයා වෙනුවෙන් උතුම් ඉලක්ක දෙකක් දියත් කර ඇත්තෙමු. එනම්: අවශ්‍ය කරන්නා වූ ප්‍රමාණයෙන් සහ ගුණාත්මකභාවයෙන් මානව කුසලතා සංවර්ධනය, සාමූහික තෝරාගැනීම් සහ සාමූහික ප්‍රයත්නයන් ළඟා කර ගැනීම වෙනුවෙන් සේවකයන් සහ කළමනාකරුවන් දැනුවත් කිරීම වශයෙනි. ප්‍රගතිශීලි සමාජයක ජීවත් වීමේ සිහිනයක් ඇති සහ අනෙක් පුද්ගලයන් එහි ජීවත්වනු දැකීමට කැමති සැමට, එම සිහිනය යථාර්ථයක් වනු බවට පත් කර ගැනීමට අපි, කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය හා එක් වන මෙන් ආරාධනා කරමු.



**මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි**
**අධ්‍යක්ෂ සහ ශාස්ත්‍රීය කමිටු සභාපති**

## පටුන


| අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| **01.** | **මානව සම්පත් අභිවර්ධන ආයතනය හැඳින්වීම** | |
| 01.1 | 2017 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන් | 1 - 5 |
| 01.2 | මානව සම්පත් අභිවර්ධන ආයතන කළමනාකරණය | |
| 01.3 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන හා සංවිධාන ව්‍යුහය (2017 ආරම්භයේදී) | |
| 01.4 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව පරිපාලන සංවිධාන ව්‍යුහය (2017 මැදභාගයේ සිට) | |
| 01.5 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව | |
| **02.** | **2017 වර්ෂය තුළ ආයතනය ළඟා කර ගත් සංවර්ධනය සහ ජයග්‍රහණ** | 5 - 9 |
| 02.1 | අධ්‍යාපනික ජයග්‍රහණ සහ සංවර්ධන | |
| 02.2 | පරිපාලනමය ළඟා කර ගැනීම් | |
| 02.3 | භෞතික පහසුකම් ළඟා කර ගැනීම් | |
| 02.4 | ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය | |
| 02.5 | කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් | |
| 02.6 | මානව සම්පත් අභිවර්ධන ආයතනයෙන් සිදු කරන ලද ප්‍රජා සත්කාරක සේවාවන් | |
| 03. | **2017 වර්ෂය තුළ මා.ස.අ. ආයතනයේ කාර්ය සාධනය** | |
| 03.1 | **අධ්‍යයන වැඩසටහන්** | |
| 03.1.1 | උපාධි අධ්‍යයන වැඩසටහන | 10 - 15 |
| 03.1.2 | පශ්චාත් උපාධි වැඩසටහන් | |
| 03.1.3 | විධායක ඩිප්ලෝමා වැඩසටහන් | |
| 03.1.4 | ඩිප්ලෝමා වැඩසටහන් | |
| 03.1.5 | සහතිකපත්‍ර වැඩසටහන් | |
| **03.2** | **2017 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළු විස්තර** | 16 - 17 |
| 03.2.1 | මානව සම්පත් කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු | |
| 03.2.2 | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු | |
| 03.2.3 | ව්‍යාප්ති වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු | |
| 03.2.4 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු | |
| 03.3 | පර්යේෂණ, නව්‍යජනන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 18 |

| | | |
|---|---|---|
| 04. | **අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු** | 19 |
| 05. | **පුස්තකාලය** | 20 |
| 06. | **මූල්‍ය ක්‍රියාකාරකම්** | |
| 06.1 | 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 21 - 50 |
| 06.2 | 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම්/ ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | |
| 06.3 | 2017 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | |
| 06.4 | 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය | |
| | ගිණුම් සඳහා සටහන් | |
| 06.5 | විගණකාධිපති වාර්තාව | |
| 06.6 | 2017 වර්ෂයට අදාළ විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස් | |

## 01. මානව සම්පත් අභිවර්ධන ආයතනය හැඳින්වීම

දශක හතරකට ආසන්න දිගු ඉතිහාසයකට උරුමකම් කියන මානව සම්පත් අභිවර්ධන ආයතනය, 1975 වසරේදී ආරම්භ විය. එය 1979 අංක 11 නියමාවලිය මගින් සේවක අධ්‍යාපන ආයතනය නමින් ස්ථාපිත කරන ලද අතර එය වර්ෂ 2006 අංක 01 නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2006 වසරේදී සේවක අධ්‍යාපන ආයතනය මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර 2017 අගෝස්තු මස 22 රජයේ විශේෂ ගැසට් නිවේදනයක් මගින් ආයතනයේ පාඨමාලා පැවැත්වීම සහ සහතික පත් ප්‍රදානය සම්බන්ධ තීරණ කිහිපයකින් නියමාවලිය නැවත සංශෝධනය කරන ලදි.

මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය සහ ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල දහසෙන් එකක් වන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයනායතනයකි. දශක හතරක පමණ ඉතිහාසයක් තුළදී, පෞද්ගලික අංශය වර්ධනය වීම, දැනුමැති ආර්ථිකය ගොඩ නැඟීම, ශ්‍රම බලකායේ ගෝලීයකරණය යනාදි ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතන පරිසරයේ සැළකිය යුතු වෙනස්කම් හා නව ප්‍රවණතා රාශියක් සිදු වී ඇත. මෙම වර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව විකාශනය වූ අතර එහි මුල් අරමුණ වූ “සේවා කණ්ඩායම් දැනුවත් කිරීම” සඳහා නව අර්ථයක් ලබා ගෙන ඇත. වර්තමානයේ “සේවා කණ්ඩායම්” යනු “කළමනාකරණ/ වෘත්තික සේවා කණ්ඩායමක්” වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම “කළමනාකරණ/ වෘත්තික සේවා කණ්ඩායම” මානව කුසලතාවලින් සංවර්ධනය කිරීමට කැපවී සිටී.

කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයකට ලක්වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයින්ට ඔවුන්ගේ කුසලතා, නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයින් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැළසීමටය. එමගින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායි දායකත්වයක් ලබා දීමට හැකි වූ අතර 1983 වනතෙක් ප්‍රදානය කරන ලද්දේ ශාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ නමුත් 1986 දී ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීමට ආරම්භ කරන ලදි. 2007 වසරේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය එම අධ්‍යයන කටයුතු ව්‍යාප්ත කරන ලද අතර පශ්චාත් උපාධි පිරිනැමීමට අරම්භ කළේය. 2015 සහ 2016 වර්ෂවල ආයතනය එහි අධ්‍යයන වැඩසටහන් ප්‍රතිශෝධනය කළ අතර අධ්‍යයන වැඩසටහන් ප්‍රථම උපාධි පාඨමාලාව, පශ්චාත් උපාධි වැඩසටහන්, විධායක ඩිප්ලෝමාවන්, ඩිප්ලෝමා සහ සහතිකපත් වැඩසටහන් යන කාණ්ඩ 05 ක් යටතේ ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි. ඒ සඳහා අවශ්‍ය අනුමැතිය නිසි පරිදි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම වෙනුවෙන් එතෙක් පවත්වාගෙන යන ලද ඇතැම් පාඨමාලාවන් තාවකාලිකව නවත්වන ලද අතර, අවශ්‍යතා පූරණය කිරීමෙන් නිසි පරිදි පවත්වාගෙන යා හැකි අධ්‍යයන වැඩසටහන් 2017 වර්ෂය තුළ පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි. ඒ අනුව, උපාධි පාඨමාලාවක්, පශ්චාත් උපාධි පාඨමාලා 04 ක්, ඩිප්ලෝමා වැඩසටහන් 05 ක්, සහ සහතිකපත් වැඩසටහන් 08 ක් පවත්වන ලදි. (2017 වසර තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්)

**ශිෂ්‍ය ඇතුළත් කරගැනීම් - 2017**




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2017, මා.ස.අ.ආ*

2017 වසරේදී ඇතුළත් කර ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 3,014 කි. වම්පස ප්‍රස්තාරය මගින් ශිෂ්‍යයන්ගේ පුමිතිරිභාවය සහ පාඨමාලා කාණ්ඩය අනුව ශිෂ්‍ය ප්‍රතිශතය පෙන්නුම් කර ඇත.

## 1.1 2017 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්

| අංකය | පාඨමාලාවේ නම |
|---|---|
| | **උපාධි වැඩසටහන** |
| 01 | ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය, ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමාව |
| | **පශ්චාත් උපාධි වැඩසටහන්** |
| 02 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 03 | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 04 | සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව |
| 05 | භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව |
| | **විධායක ඩිප්ලෝමා/ ඩිප්ලෝමා වැඩසටහන්** |
| 06 | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 07 | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 08 | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව |
| 09 | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව |
| 10 | කළමනාකරණ ඩිප්ලෝමාව |
| | **සහතිකපත් පාඨමාලා** |
| 11 | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 12 | ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව |
| 13 | ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 14 | කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 15 | පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 16 | පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව |
| 17 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික |
| 18 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම |

අභියෝගාත්මක ගෝලීය තත්ත්වයන් හමුවේ මුහුණ දීම මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් පරිණත, බුද්ධිමත් "දැනුම භාවිත කරන්නන්" ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුනුවා ගැනීම උදෙසා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය සම්ප්‍රදායන් සහ උසස් ශාස්ත්‍රීය ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයක් සිදු කරමින් සිටී. යහපාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතිතන ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් යහසේවක වෙළඳ නාමයක් ඇති රාජ්‍ය ආයතනයක් බවට පත්වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

## 01.2 මානව සම්පත් අභිවර්ධන ආයතන කළමනාකරණය

මානව සම්පත් අභිවර්ධන ආයතන ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන පූර්ණ කාලීන ප්‍රධාන විධායක නිලධාරියා වේ.

අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය මණ්ඩලයේ සභාපතිවරයා වන අතර ආයතනික අධ්‍යයන කමිටුවේ නිලබලයෙන් පත් වූ නිලධාරියෙක් ද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අතර, ආයතනයේ ශික්ෂණය පවත්වාගෙන යාමේ වගකීම් දරන්නා ද වේ.

2015 අගෝස්තු 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි වසර තුනක කාලයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ සහ සංවිධාන අධ්‍යයන අංශයේ සහාය මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා ආයතන අධ්‍යක්ෂවරයා ලෙස තේරී පත් විය.

## 01.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන සංවිධාන ව්‍යුහය (2017 වර්ෂය මුල් භාගය)




2017 වර්ෂය තුළදී ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය ඇතිව පහත දැක්වෙන නව පරිපාලන ව්‍යුහය හඳුන්වාදෙන ලදි. මෙම නව ව්‍යුහය ආයතනයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකස් කොට ඇත.

### 1.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව පරිපාලන සංවිධාන ව්‍යුහය (2017 වර්ෂයේ මැදභාගයේ සිට)




### 1.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව

ශාස්ත්‍රීය කමිටුව අධ්‍යයන මණ්ඩල 04 කින් සමන්විත වූ අතර වඩා ඵලදායිතාවයක් අපේක්ෂාවෙන් 2017 වසර තුළ අධ්‍යයන කමිටු ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන ලදි. ඒ අනුව පැවති අධ්‍යයන මණ්ඩලයක් විසුරුවා හැර නව අධ්‍යයන කමිටු දෙකක් (02) සමඟ අධ්‍යයන මණ්ඩල හතරක් (04) ස්ථාපිත කරන ලදි. ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය ඇතිව පිහිටුවනු ලැබූ නව අධ්‍යයන මණ්ඩල වන්නේ: පශ්චාත් උපාධි සහ පර්යේෂණ අධ්‍යයන මණ්ඩලය, උපාධි අධ්‍යයන මණ්ඩලය, භාෂා ඉගැන්වීම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය සහ ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලයයි. විසුරුවා හරින ලද අධ්‍යයන මණ්ඩලය වන්නේ: මානව සම්පත් අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය. ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන ශාස්ත්‍රීය කමිටුව, ආයතනයේ අධ්‍යයන-පරිපාලන හා කළමනාකරණ කටයුතු පරිපාලනය හා අධීක්ෂණය කරනු ලබයි. එහි සාමාජිකයන් පහත දක්වා ඇත.

**ශාස්ත්‍රීය කමිටුව (රැස්වීම් 11)**

| | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි | සභාපති |
|---|---|---|
| 02 | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 03 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 04 | මහාචාර්ය එම්.වී. විද්‍යාපතිරණ මිය | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 05 | මහාචාර්ය කේ. ගුණවර්ධන මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 06 | මහාචාර්ය නයනි මෙලගොඩ මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 07 | ආචාර්ය දිනුකා විජේතුංග මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 08 | එච්.එම්.එන්. වරකාඋල්ල මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 09 | එන්. සෙල්වකුමාරන් මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 10 | ඩී.එම්.එස්. දසනායක මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 11 | කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |
| 12 | එම්.පී.පී. හේමකුමාර මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 13 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 14 | බී.කේ.පී. අබේසූරිය මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |

- **මා.ස.අ. ආයතන අධ්‍යයන මණ්ඩල මගින් පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව**

| | අධ්‍යයන මණ්ඩලය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ අධ්‍යයන මණ්ඩලය (*2017 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක විය.*) | 02 |
| 02 | උපාධි වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය (*2017 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක විය.*) | 01 |
| 03 | භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය | 09 |
| 04 | විධායක සංවර්ධන අධ්‍යයන මණ්ඩලය | 10 |

නව ආයතනික සංවිධානාත ව්‍යුහයට අනුව ශාස්ත්‍රීය කමිටුව සඳහා කමිටු 6 ක් ඇතුළත් වේ. මේවන විට ඉන් කමිටු 04 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. එහි සාමාජිකයන් පහත දැක්වේ.

| | කමිටුව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි) | 04 |
| 02 | මූල්‍ය කමිටුව | 09 |
| 03 | පුස්තකාල කමිටුව | 04 |
| 04 | තත්ත්ව ආරක්ෂණ කමිටුව | 01 |

## 2. 2017 වර්ෂය තුළ ආයතනය ළඟා කරගත් සංවර්ධනය සහ ජයග්‍රහණ

### 2.1 අධ්‍යාපනික ජයග්‍රහණ සහ සංවර්ධනය

- 2017 වසරේ මානව සම්පත් අභිවර්ධන ආයතනයෙන් අධ්‍යයන කාණ්ඩ 04 ක් යටතේ පශ්චාත් උපාධිලාභී/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, උපාධිලාභී සහ සුදුසුකම් ලැබූ ලෙසින් දේශීය දැනුම් සේවා කාණ්ඩයට දායාද කරන ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හාරදහස් එකසිය දහතුනකි (4,113). එය පිළිවෙළින් පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභීන් හාරසිය අටක් (408), උපාධිලාභීන් එකසිය තිස්හතක් (137), විධායක ඩිප්ලෝමා/ ඩිප්ලෝමා සහතිකපත්ලාභීන් දෙසිය විස්සක් (220) සහ සහතිකපත් සුදුසුකම් ලැබූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුන්දහස් තුන්සිය හතලිස් අටක් (3,348)කින් සමන්විත විය. සමස්ත පාඨමාලා නිමැවුමෙන් 41% ක් වූ වැඩිම නිමැවුම් අනුපාතය පශ්චාත් උපාධි කාණ්ඩයේ පාඨමාලාවන්ගෙන් පෙන්නුම් කෙරුණු අතර අඩුම උත්පාදනය වූ 15% සටහන් වූයේ සහතිකපත් කාණ්ඩයේ වැඩසටහන්වලිනි.

**මා.ස.අ. ආයතනයේ 2017 වර්ෂයේදී සුදුසුකම් ලැබූ/උපාධිලාභී ශිෂ්‍ය අනුපාතය**




*මූලාශ්‍රය: සම්ක්ෂිත දත්ත, 2017, මා.ස.අ.ආ*



- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2017 අප්‍රේල් මස 25 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී කොළඹ විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණු අතර එහිදී ඩිප්ලෝමාලාභීන් හාරසිය පනස් දෙකකට (452) ඩිප්ලෝමා පිරිනමන ලදී.

- පශ්චාත් උපාධි පාඨමාලාවන්හි විෂය මාලා වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීමෙන් අනතුරුව නව විෂය මාලාවන් 2017 අප්‍රේල් මස 26 වන දින විශ්වවිද්‍යාල සනාථන සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. නව විෂය නිර්දේශයන් සඳහා 2017 වසරේ අගෝස්තු මස 16 වන දින පාලක සභාවේද අනුමැතිය ලද අතර නවීකරණය කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා කිහිපයක් 2017 වසරේදීම ආරම්භ කිරීමට හැකියාව ලැබුණි.

- මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලාව සහ පශ්චාත් උපාධි පාඨමාලාවන්හි අධ්‍යයන මෙන්ම පාඨමාලා පරිපාලන කටයුතු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මනාව උපයෝජනයට කටයුතු කෙරිණ. මෙම වැඩපිළිවෙළ මගින් ඉගෙනුම්/ ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිදුවන කඩදාසි භාවිතය අවම කිරීමට හැකියාව ලැබිණ.

- අධ්‍යයන තත්ත්ව නඟා සිටුවීමේ අරමුණින් ශිෂ්‍ය පැමිණීමේ ප්‍රතිපත්තිය අනිවාර්ය අංගයක් ලෙස ක්‍රියාත්මක කිරීමට මෙන්ම පාඨමාලාවන්හි විෂය ඒකකයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම උදෙසා දේශක ඇගයීමේ ක්‍රමවේදය සාර්ථකව උපයෝජනයට කටයුතු කරන ලදී.

- අධ්‍යයන නිවාඩු ලබා සිටි ආයතන කථිකාචාර්යවරු දෙදෙනෙක් නැවත සේවයට වාර්තා කරන ලද අතර, ඉන් එක් කථිකාචාර්යවරයෙක් (ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර මහතා) චීනයේ වෝහාන් විශ්වවිද්‍යාලයෙන් තම ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී. තවත් කථිකාචාර්යවරයෙක් (කේ.ඩී.එන්. හේවගේ මහතා) කොළඹ විශ්වවිද්‍යාලයෙන් දර්ශනශූරි උපාධි සුදුසුකම් ලබා ගන්නා ලදී.

- 2017 නොවැම්බර් මස 10 සහ 11 යන දිනවල මැලේසියාවේ, මලයා විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන පීඨය විසින් පවත්වන ලද *"21 වන සියවසේ උසස් අධ්‍යාපන ඉගෙනුම් සහ අධ්‍යාපන කළමනාකරණය"* වැඩමුළුව සඳහා ආයතනයේ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහාය සහ අනධ්‍යයන යන සියලු කාණ්ඩවලින් සමන්විත වූ සේවක කණ්ඩායමක් සහභාගි විය.

## 2.2 පරිපාලනමය ළඟා කර ගැනීම්

- විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මානව සම්පත් අභිවර්ධන ආයතන නවතම සංශෝධිත නියමාවලිය අංක 2033/10 දරන 2017 අගෝස්තු මස 22 වන දින රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදි.

- ආයතනයේ සියලුම සේවා කාණ්ඩවල පැවති පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, දැනටමත් එක් කථිකාචාර්යවරියක් සහ කළමනාකරණ සහකාර තනතුර සඳහා සේවකයින් එකොළොස්දෙනෙකු (11), පුස්තකාල තොරතුරු සහකාරවරියන් දෙදෙනෙකු (02) සහ වැඩ සහායක තනතුර සඳහා එක් අයෙකු (01), කම්කරු තනතුර සඳහා දෙදෙනෙකු (02) සේවයට අනුයුක්ත කොට ගැනීමට හැකියාව ලැබිණ.

- ශාස්ත්‍රීය කමිටුවේ මෙන්ම විශ්වවිද්‍යාලයේ මගපෙන්වීමෙන් අධ්‍යයන කටයුතු විධිමත් කිරීම සඳහා ආයතනය මගින් පවත්වනු ලබන සියලු පාඨමාලාවන් සඳහා නිර්දේශිත අනුමැති ලබා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් මෙතෙක් පවත්වාගෙන ආ ඇතැම් පාඨමාලාවන් තාවකාලිකව නවතා දැමීමට 2017 වර්ෂයේදී සිදු විය.

- ආයතන කාර්ය මණ්ඩලයේ සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් කාර්ය මණ්ඩල සංවර්ධන සහ පුහුණු වැඩසටහන් මාලාවක් 2017 වසරේදී ක්‍රියාත්මක කරන ලද අතර සැලසුම් කරන ලද පරිදි පුහුණු වැඩමුළු පහක් (05) පමණ සාර්ථකව පවත්වන ලදි.

- පවත්වාගෙන යනු ලබන වැඩසටහන්වල සඵල ඵලදායිතාවයක් අපේක්ෂාවෙන් 2017 වසර තුළ අධ්‍යයන කමිටු ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන ලද අතර ඒ අනුව පැවති අධ්‍යයන මණ්ඩල දෙකක් විසුරුවා හැර නව අධ්‍යයන කමිටු දෙකක් (02) සමඟ අධ්‍යයන මණ්ඩල හතරක් (04) ස්ථාපිත කරන ලදි. ඒවා නම්, පශ්චාත් උපාධි සහ පර්යේෂණ අධ්‍යයන මණ්ඩලය, ප්‍රථම උපාධි අධ්‍යයන මණ්ඩලය, භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය හා ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය වශයෙනි.

## 2.3 භෞතික පහසුකම් ළඟා කර ගැනීම්

- 2017 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයට සැළකිය යුතු ප්‍රමාණයකින් යටිතල පහසුකම් දියුණු කර ගත හැකි විය. 2017 මැද භාගය වන විට ආයතන ගොඩනැගිල්ලේ පවතින ව්‍යුහයට දිගුවක් ලෙසින් නව ඒකක කිහිපයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකියාව ලැබිණ. ආයතනයේ සේවක අවශ්‍යතාවයට සරිලන ලෙස ආයතන ගොඩනැගිල්ලේ පවතින ව්‍යුහයට සමගාමීව නව වැසිකිළි සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

- පරිගණක විද්‍යාගාරය සම්පූර්ණයෙන් නවීකරණයට කටයුතු ආරම්භ කිරීම. පැවති විද්‍යාගාර ව්‍යුහය පමණක් නොව නවීන පරිගණක උපාංගයන්ගෙන් සමන්විත පරිගණක විද්‍යාගාරයක් සකස් කිරීමට කටයුතු සම්පාදනය කෙරිණ.

- පැවති ආයතන ශ්‍රවණාගාරයද එහි අභ්‍යන්තර ව්‍යුහය මෙන්ම, නවීන උපාංගයන්ගෙන්ද යුක්තව නවීකරණය කිරීමටද කටයුතු ආරම්භ කෙරිණ.

- ආයතනයට උචිත මලාපවහන පද්ධතියක් (Sewerage System) ස්ථාපිත කිරීම.

- යහපාලන සහ විනිවිදභාවයකින් යුත් තිරසර ආර්ථික සංවර්ධනයක් සහතික කිරීම සඳහා වන රාජ්‍ය දැක්මේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2018 - 2022 කාලය සඳහා ආයතනනික සංයුක්ත සැලැස්ම සකස් කිරීම උදෙසා කටයුතු ආරම්භ කරන ලදි.

## 2.4 ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය



- 2017 වර්ෂයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් කළමනාකරණ හා මධ්‍යම මට්ටමේ කළමනාකරණ පාඨමාලා හදාරන සිසුන් සඳහා වැඩමුළු 10 ක් පමණ සාර්ථකව නිම කරන ලදි. මෙම වැඩමුළු ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතියට අනුකූලව සිසුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කොට ඇත. එම වැඩමුළු සඳහා සිසුන් හත්සිය අසූදෙදෙනෙකු (782) පමණ සහභාගි විය.

- 2017 වසරේදී සේවා කළමනාකරණ වැඩසටහනේ ඉගෙනුම ලබන පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන් 02 ක් සාර්ථකව පවත්වන ලද අතර ඒ සඳහා විද්‍යාර්ථීන් පනස් අට (58) දෙනෙකු සහභාගි විය.

- භූතොරතුරු විද්‍යාපති පාඨමාලාවේ විද්‍යාර්ථීන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් ආයතනය විසින් පවත්වන ලද අතර, 2017 ජුනි මස 03 සහ 04 යන දිනවල පැවති මෙම චාරිකාව සඳහා විද්‍යාර්ථීන් හැට හතක් (67) ක් සහභාගි විය. ගුවන් ඡායාරූපකරණය සහ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති භාවිතය සම්බන්ධයෙන් මෙහිදී මුඛ්‍ය අවධානය යොමු කොට තිබුණි.

## 2.5 කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම්



- ඉන්දියාවේ බැංගලෝර්හි පීඊඑස් විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද වර්ෂ 2017 - ජාත්‍යන්තර සේවක ක්‍රීඩා සැණකෙළියේ, සේවක ක්‍රිකට් තරගාවලියෙන් තෙවන ස්ථානය දිනා ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලයීය කණ්ඩායමට හැකි වූ අතර ආයතනයේ සේවයේ නියුක්ත එම්.එස්.සි පෙරේරා සහ කේ.ඩී.පී. කුරුගම යන මහත්වරු එම කණ්ඩායමේ ක්‍රීඩකයන් ලෙස සහභාගි විය.

- බී.එල්.ඊ. ක්‍රිකට් සැණකෙළිය - 2017 ක්‍රිකට් තරගාවලිය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ සිසුන් විසින් සංවිධානය කරන ලද අතර එම තරගාවලිය 2017 ඔක්තෝබර් මස 01 දින කොළඹ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා භූමියේදී උත්කර්ෂවත්ව පැවැත්විණ. තවද, ක්‍රිකට් සැණකෙළිය උපාධි වැඩසටහනේ විද්‍යාර්ථීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතන කාර්ය මණ්ඩලයට පමණක් සීමාවිය. කණ්ඩායම් 24 ක් පමණ සහභාගි වූ මෙම තරගාවලියේදී ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ තෙවන වසර කණ්ඩායම විසින් ශූරතාවය දිනා ගන්නා ලදී.

### 5.6 මානව සම්පත් අභිවර්ධන ආයතනයෙන් සිදු කරන ලද ප්‍රජා සත්කාරක සේවාවන්

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන ලද ප්‍රජා සත්කාරක වැඩසටහනක් ලෙස බලංගොඩ අඩු පහසුකම් සහිත පාසලක් වන වැලිපතයාය ප්‍රාථමික විද්‍යාලයේ සිසු දරුවන්ට පුස්තකාල පොත් ලබා දීමේ වැඩසටහනක් 2017 සැප්තැම්බර් මස 17 වනදින එම විද්‍යාලයේ සිසු දරු-දැරියන්, ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ විද්‍යාර්ථීන් සහ ආයතන අධ්‍යයන-අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

  කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ඉතා කුඩා භූමි ඒකකයක් තුළ පවත්වාගෙන යනු ලබන මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව්‍යකරණ වැඩපිළිවෙළෙහි එක් අංගයක් ලෙස ආයතන ව්‍යුහය වෙනස් කිරීමට වැඩකටයුතු 2016 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. එම අවශ්‍යතාවය පූරණය කරනුවස් වඩාත් කාර්යක්ෂම, නූතන තාක්ෂණික අංගයන්ගෙන් සමන්විත ඵලදායි-කාර්යක්ෂමතාවයෙන් යුත් පරිගණක උපාංග, අවකාශීය ඉඩ ප්‍රමාණය ඉතිරි කර ගතහැකි කාර්යාලයීය ගෘහ භාණ්ඩයන්ගෙන් යුත් නවීන පන්නයේ කාර්යාලයීය උපකරණ බොහොමයක් 2017 වසර තුළ ආයතනය විසින් මිලදී ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයතනයේ මෙතෙක් භාවිත කරන ලද නමුත් නව ක්‍රියාවලියට නොගැලපෙන භාණ්ඩ, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන භාණ්ඩ විශ්වවිද්‍යාලයීය ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව යම් යම් ආයතන වෙත පරිත්‍යාග කිරීම් පසුගිය වර්ෂය පුරාවටම සිදු කරන ලදී.

- ඒ අනුව සමස්තයක් ලෙස 2017 වර්ෂය පුරාවටම ආයතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන පාසල, කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨ මාධ්‍ය ඒකකය, ශ්‍රීපාලි මණ්ඩපය සහ රජයේ පාසල් 10ක් සඳහා පරිත්‍යාග කරන ලදී. මෙම පරිත්‍යාග කරන ලද උපකරණ අතර පරිගණක උපාංග 322ක්, කාර්යාලයීය ගෘහභාණ්ඩ 308, ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරණ 31ක් සහ ජාල උපාංග 14 කින් සමන්විත විය. එක් එක් ආයතන වෙත ප්‍රදානය කරන ලද භාණ්ඩ විස්තරය පහත දක්වා ඇත.

| | ආයතනය | පරිගණක උපාංග | කාර්යාල ගෘහභාණ්ඩ | ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ | ජාලකරණ උපාංග | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | කන්දකැපු උල්පත ප්‍රාථමික විදුහල - බදුල්ල | 24 | 10 | - | - | 34 |
| 2 | උඩවෙල ද්විතියික පාසල - බදුල්ල | 25 | 11 | - | - | 36 |
| 3 | කෙකාවල කණිෂ්ඨ පාසල - මහියංගනය | 25 | 10 | - | - | 35 |
| 4 | ශ්‍රී ධම්මානන්ද මහා විද්‍යාලය - බදුල්ල | 18 | 8 | - | - | 26 |
| 5 | වැලිකේමුල්ල මහා විද්‍යාලය - බදුල්ල | 38 | 18 | - | - | 56 |
| 6 | ශ්‍රී සුදර්මාවාස පිරිවෙණ - උඩුනුවර හාලිඇල | 35 | 18 | - | - | 53 |
| 7 | කදන ශ්‍රී සීවලි මහා විද්‍යාලය - ස්ප්‍රිංවැලි | 39 | 18 | - | - | 57 |
| 8 | බැද්දේගම මහා විද්‍යාලය - ස්ප්‍රිංවැලි | 69 | 35 | - | - | 104 |
| 9 | ශ්‍රී රාහුල මහා විද්‍යාලය - බදුල්ල | 22 | 10 | - | - | 32 |
| 10 | මිලැත්තාව මහා විද්‍යාලය - ගිරාඳුරුකෝට්ටේ | 27 | 11 | - | - | 38 |
| 11 | ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය | - | 159 | - | - | 159 |
| 12 | විද්‍යා පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය | - | - | 31 | - | 31 |
| 13 | පරිගණක අධ්‍යයන පාසල - කොළඹ විශ්වවිද්‍යාලය | - | - | - | 14 | 14 |
| | | **322** | **308** | **31** | **14** | **675** |

# 3. 2017 වර්ෂය තුළ මා.ස.අ. ආයතනයේ කාර්ය සාධනය

## 3.1 අධ්‍යයන වැඩසටහන්

2017 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් අංක 06.1 සටහනේ දක්වන ලද අධ්‍යයන වැඩසටහන් 18 ක් පහත කාණ්ඩ 05 ක් යටතේ පවත්වන ලදී. ඒවා නම්:

1) උපාධි අධ්‍යයන වැඩසටහන
2) පශ්චාත් උපාධි වැඩසටහන්
3) විධායක ඩිප්ලෝමා වැඩසටහන්
4) ඩිප්ලෝමා වැඩසටහන්
5) සහතිකපත්‍ර වැඩසටහන්

### 3.1.1 උපාධි අධ්‍යයන වැඩසටහන

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය වසර 38 ක් පුරා රාජ්‍ය භාණ්ඩාගාර අනුග්‍රහය මගින් පවත්වාගෙන යනු ලබන එකම අධ්‍යයන වැඩසටහන වේ. මෙම වැඩසටහන උපාධිය සහ ඩිප්ලෝමාව වශයෙන් ප්‍රධාන අංග දෙකකින් (02) සමන්විතය. උපාධි පාඨමාලාවේ කාලය වසර 03 ක් එනම්, අධ්‍යයන සෙමෙස්තර 06 කින් සමන්විතය. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අය උපාධි පළමු වසර සඳහා බඳවා ගැනීමට අධ්‍යයන සෙමෙස්තර 02 කින් යුත් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවත් ඊට අදාළ පරීක්ෂණත් සම්පූර්ණ කළ යුතුය. මෙම උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ඇතුළත් වීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය යන දෙකම සමත් විය යුතුය.

2017 වර්ෂය තුළ මෙම අධ්‍යයන වැඩසටහන සඳහා අයදුම්කරුවෝ තුන්සිය හැට නවයක් (369) තෝරා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය අතර ඉන් 45% ක් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලදහ. උපාධි අපේක්ෂක අයදුම්කරුවන් එකසිය අසූ හතරක් (184) පාඨමාලාවට ලියාපදිංචි විය.




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2017, මා.ස.අ.ආ.*

ප්‍රස්තාර අංක 3 මගින් පෙන්වා ඇති පරිදි උපාධි වැඩසටහනේ පුරුෂ සංයුතිය 52% කි. 2016 වර්ෂයේ මෙන්ම මෙම වසරේදීත් පුරුෂ සංයුතිය ස්ත්‍රී ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි අගයක් ගත්තද, 2017 වසරේ පුරුෂ ශිෂ්‍ය සංයුතිය 2016 වසරට වඩා 4% කින් අඩුවී තිබේ.

පාඨමාලා සමාරම්භක උත්සවය 2017 මැයි මස 28 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය නව කලාගාරයේදී පැවැත්විණ. 2017 වසර තුළ අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම්වල ලියාපදිංචි වූ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 537 කි. 2013 වසරේ සිට මේ දක්වා වසර 5 ක කාල පරාසය තුළ පාඨමාලා කාර්ය සාධනය පහත දක්වා ඇත. 2017 වසරේදී සමස්ථ උපාධිලාභී උත්පාදන ප්‍රතිශතය 57.6% ක් ලෙස පෙන්නුම් කරන ලදී.

**2013 - 2017 කාලය තුළ ශ්‍රම අධ්‍යාපනවේදි වැඩසටහනේ කාර්ය සාධනය**

| වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධිධාරී/ සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[1] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය | 189 | 206 | 157 | 194 | 184 | 153 | 153 | 119 | 124 | 137 |
| ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමාව | 55 | 59 | 51 | 54 | 48 | 49 | 37 | 42 | 32 | 30 |

**ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ කාර්ය සාධනය : 2013 - 2017**







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2013-2017, මා.ස.අ.ආ.*

**ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමා පාඨමාලාවේ කාර්ය සාධනය : 2013 - 2017**







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2013-2017, මා.ස.අ.ආ.*

### 3.1.2 පශ්චාත් උපාධි වැඩසටහන්

2017 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් විවිධ අධ්‍යයන පථයන් ආවරණය කරමින් පශ්චාත් උපාධි පාඨමාලා 04 ක් පවත්වන ලදි. මෙම වැඩසටහන්, කළමනාකරුවන්ට ඔවුන්ගේ විෂය පථයන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම අරමුණු කොට ඇත. මානව සම්පත් අභිවර්ධන ආයතනය කළමනාකරණ අධ්‍යයනය ආශ්‍රිත පශ්චාත් උපාධි පාඨමාලා 03 ක් මෙහෙයවයි. කළමනාකරණ වෘත්තීන්හි යෙදී සිටින සිසුන්ට සියලු කළමනාකරණ ශික්ෂණ මූඛ්‍ය දැනුම හා අවබෝධය ලබා ගත හැක. එමෙන්ම ඉතා විශ්වාසයෙන් යුතුව ව්‍යාපාරික ගැටලු හමුවේ මුහුණ දීමටත් ගැටලු විසඳීම සඳහා අවශ්‍ය සංකල්පමය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කිරීමත් මෙමගින් සිදු කෙරේ.

*[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

භූතොරතුරු සහ ආපදා කළමනාකරණ විශ්ලේෂණ හා පාලන යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාපති පාඨමාලාවන් දෙකක් ආයතනය විසින් පවත්වනු ලැබුවද, ආපදා කළමනාකරණ විශ්ලේෂණ හා පාලන විද්‍යාපති පාඨමාලාවේ විෂයමාලා සංශෝධනයෙන් පසු අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා පාඨමාලාව තාවකාලිකව නවතා තිබීම හේතුවෙන් 2017 වර්ෂයේදී භූතොරතුරු විද්‍යාපති පාඨමාලාවේ අධ්‍යයන කටයුතු පමණක් සිදු කෙරිණ. මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ භූතොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රයන්හි එම අදාළ අංශවල තක්සේරු කිරීම්, අධීක්ෂණය, ඇගයීම සහ සම්පත් කළමනාකරණයේ විශේෂඥභාවය ලබා දීමටයි.




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2017, මා.ස.අ.ආ.*

ව්‍යාපාර කළමනාකරණ සහ මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලා 02 සඳහා වෘත්තිකයන් 149 ක් ලියාපදිංචි වූ අතර වැඩිම ශිෂ්‍ය ලියාපදිංචිය ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවෙන් සටහන් විය. 2017 වර්ෂය තුළ ආයතනයේ පශ්චාත් උපාධි හදාරන ලද සමස්ථ විද්‍යාර්ථීන් පශ්චාත් උපාධිලාභි නිමැවුම 2013 සිට 2017 දක්වා කාලය තුළ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි. 2016 වර්ෂයේදී 269 ක් ව පැවති පශ්චාත් උපාධිලාභී නිමැවුම 2017 වර්ෂයේදී 408 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී එය 21% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

ස්ත්‍රී-පුරුෂ සංයුතිය සැලකීමේදී පුරුෂ සංඛ්‍යාව ස්ත්‍රී සංඛ්‍යාවට වඩා වැඩි අගයක් පෙන්නුම් කෙරිණ. එය ස්ත්‍රී 44% කට පුරුෂයින් 56% ක් වශයෙනි. 2016 වර්ෂය සඳහා වූ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2017 නොවැම්බර් 23 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එහිදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද පශ්චාත් උපාධි පාඨමාලා 5 කින් පශ්චාත් උපාධිලාභීන් 298 ක් උපාධි ලබන ලදී.

**2013 - 2017 කාලය තුළ පශ්චාත් උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය කාර්ය සාධනය**

| | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධිධාරී ශිෂ්‍ය සංඛ්‍යාව[2] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| 01 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 162 | 160 | 172 | 61 | 95 | - | 77 | 87 | - | 127 |
| 02 | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 173 | 146 | 135 | 67 | 54 | 64 | 113 | 85 | 93 | 135 |
| 03 | සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය | - | 112 | 121 | 66 | - | - | - | 43 | 88 | 54 |
| 04 | භූ විද්‍යා තොරතුරු විද්‍යාපති උපාධිය | 50 | 51 | - | 83 | - | 11 | 07 | 07 | 62 | 54 |
| 05 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලන විද්‍යාපති උපාධිය | 65 | 50 | - | - | - | - | - | 25 | 26 | 38 |
| | එකතුව | 450 | 519 | 428 | 277 | 149 | 75 | 197 | 247 | 269 | 408 |

**මා.ස.අ. ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය : 2013 - 2017**







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2013-2017, මා.ස.අ.ආ.*

*[2] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### 3.1.3 විධායක ඩිප්ලෝමා වැඩසටහන්

දිවයින පුරා සිටින වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තීය විෂය ක්ෂේත්‍රයන්හි විෂය ප්‍රාගුණ්‍ය සුදුසුකම් ලබා ගැනීමට විධායක ඩිප්ලෝමාවන් ඉතාමත් සුදුසු වේ. රැකියා ක්ෂේත්‍රය තුළ මධ්‍යම මට්ටමේ වෘත්තිකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කොට ඇත. මෙම වැඩසටහන්වල මූලික අරමුණ වන්නේ කළමනාකරණ වෘත්තිකයන්ට ඔවුන් නියුක්ත වන සේවා අංශයන්හි විශේෂිත දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීමයි.

එමෙන්ම, විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් පුද්ගල සංවර්ධනය කේන්ද්‍ර කොටගෙන ඇත්තේ සහභාගිවන්නන් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේදී පදනමක් ලෙස තම හැසිරීම් රටාවන් අභියෝගයට ලක් කිරීමේ පෞද්ගලික අත්දැකීමක් ඔවුන්ට අත්‍යාවශ්‍යවන බවට තිබෙන ස්ථිරසාර විශ්වාසය මත පදනම්වය.

අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම උදෙසා ආයතනය විසින් පවත්වාගෙන යුන ලැබූ විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කොට තිබූ බැවින් 2017 වසරේ නව පාඨමාලාවන් ආරම්භ නොකරන ලද අතර 2015 සහ 2016 වසරවල ආරම්භ කොට තිබූ පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතු පමණක් 2017 වසරේ ක්‍රියාත්මක විය. ඒ අනුව, 2017 වසර තුළ ආයතනයේ විධායක ඩිප්ලෝමා පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතුවල නිරත වූ ශිෂ්‍ය සංඛ්‍යාව 142 කි.

**මා.ස.අ. ආයතනයේ 2013 - 2017 කාලය තුළ විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය**

| | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[3] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| 01 | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 68 | 97 | 113 | 35 | - | 38 | 34 | 61 | 81 | - |
| 02 | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 29 | - | 31 | - | - | - | - | 13 | - | 17 |
| 03 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 45 | 43 | - | - | - | - | 25 | - | 23 | - |
| 04 | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව | 81 | 83 | 94 | 107 | - | 62 | 50 | 59 | 51 | - |
| 05 | ශ්‍රව්‍ය-දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව | - | 38 | - | - | - | - | - | - | 12 | - |
| 06 | සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | - | 35 | - | - | - | - | - | 34 | - |
| | එකතුව | **223** | **261** | **273** | **142** | - | **100** | **109** | **133** | **201** | **17** |

**මා.ස.අ. ආයතනයේ විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය: 2013 - 2017**







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2013-2017, මා.ස.අ.ආ.*

*[3] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### 3.1.4 ඩිප්ලෝමා වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් වර්ග තුනක් යටතේ ඩිප්ලෝමා පාඨමාලා මෙහෙයවනු ලබයි. එය කළමනාකරණය, මානව ශාස්ත්‍ර සහ භාෂා වැඩසටහනකින් සමන්විත වේ. මෙම වැඩසටහන් මූලික, ද්විතියික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිය ජීවිතය තුළ තමන්ගේ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියා ඔප්නැංවීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීමේ හැකියා වර්ධනය කිරීම අරමුණු කොට ගෙන නිර්මාණය කොට ඇත. විවිධාකාර වූ සිසුන්ට ඔවුන්ගේ විවිධ වූ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට මෙම ඩිප්ලෝමාවන් රැකුලක් වේ. ඇතැම් විට ඒවා අධ්‍යයන කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය දුරලීම සඳහාත් අමතර වෘත්තිය පුහුණුවක් සහ සුදුසුකම් ලබා ගැනීමටත් පාලමක් ලෙස මෙහෙවර කරනු ලබයි. ඩිප්ලෝමා පාඨමාලාවකට වටිනා විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කළ හැක.

බාහිර පාර්ශවයන් සමග සහයෝගීව දියත් කරන ලද ඇතැම් අධ්‍යයන පාඨමාලා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් වසර තුළදී තාවකාලිකව නවත්වනු ලැබිය. එම නිසා 2017 වර්ෂයේ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වසර හා සැසඳීමේදී 54% ක පමණ අඩුවීමක් දක්නට ලැබිණ. 2017 වසරේ ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කර ඇත්තේ දමිළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාවෙන් පමණක් වන අතර එය 96 කි. ශිෂ්‍ය ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 24% ක් පුරුෂයින් වූ අතර ස්ත්‍රීන් 76% ක බහුතර ශිෂ්‍ය ලියාපදිංචියක් පෙන්නුම් කළහ.

**මා.ස.අ. ආයතනයේ 2013 - 2017 කාලය තුළ ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය**

| අංකය | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[4] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| 01 | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව | - | 74 | 58 | 20 | - | - | 64 | 23 | 37 | - |
| 02 | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව | 44 | - | 50 | - | - | 11 | 25 | - | - | - |
| 03 | උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව | 25 | 50 | 34 | - | - | 28 | 25 | 36 | 23 | 55 |
| 04 | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව | 120 | 120 | 163 | 124 | 96 | 96 | - | 124 | 123 | 100 |
| 05 | තොරතුරු තාක්ෂණවේදී කළමනාකරණ ඩිප්ලෝමාව | - | 57 | - | - | - | - | 25 | 10 | 13 | - |
| 06 | කළමනාකරණ ඩිප්ලෝමාව | - | - | 22 | 34 | - | - | - | 11 | 10 | - |
| | එකතුව | **189** | **301** | **327** | **178** | **96** | **135** | **139** | **204** | **206** | **155** |

**ඩිප්ලෝමා වැඩසටහන්වල ශිෂ්‍ය කාර්ය සාධනය : 2013 - 2017**







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2013-2017, මා.ස.අ.ආ.*

*[4] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### 3.1.5 සහතිකපත්‍ර වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය වෘත්තිමය සංවර්ධනයක් කරා ප්‍රවේශ වීමට අධ්‍යයනයේ නියුක්ත ශිෂ්‍යයින් පුහුණු කිරීම සඳහා විවිධ වූ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් වැඩසටහන් ප්‍රදානය කරනු ලබයි. 2017 වසර තුළ සහතිකපත්‍ර පාඨමාලාවන් 08 ක් පැවැත්විණ. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් වසර 30 කට වඩා කාලයක් පුරා පවත්වාගෙන යයි. ඉන් 05 ක් විවිධ මට්ටම් සඳහා වූ ඉංග්‍රීසි භාෂා පාඨමාලා විය. සහතිකපත් වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 78% ක්ම ලියාපදිංචි වී ඇත්තේ ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහාවේ. ඊට අමතරව, දමිළ භාෂා පාඨමාලාවක්, කළමනාකරණ පාඨමාලාවක් සහ තොරතුරු තාක්ෂණවේදි පාඨමාලාවක් පවත්වන ලදි. 2017 වසර තුළ ලියාපදිංචි වී ඇති සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 2,537 ක් වන අතර ඉන් 66% ක් ශිෂ්‍යාවන්වේ.

**2013 - 2017 කාලය තුළ සහතිකපත්‍ර වැඩසටහන්වල කාර්ය සාධනය**

| | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[5] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (අ) | 1985 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය සහ 16 වන වගන්තිය සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලේ 16 වන වගන්තිය | ආයතනයේ සේවයේ යෙදී සිටින සේවකයින් වෙනුවෙ නියමිත දිනවලදී දායක මුදල් නොගෙවීම හේතුවෙන් දෙ වර්ෂවලට අදාලව සේවකයා විසින් ගෙවිය යුතු සියයට 8 දායක මුදල හා අධිභාර ලෙස එකතුව රු.8,982,751 සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ගෙවා තිබුණි. |

4

| | |
|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව රු.36,786,564 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 2004 ජුලි 29 දිනැති පීඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පැවති රු.155,451,216 ක ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2004 ජනවාරි 26 දිනැති අංක පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා රු.5,572,787 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.42,996,700 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.61,576,424 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,579,724 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටුප් හා දීමනා වියදම රු.25,094,713 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු.15,174,119 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.42,996,700 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.49,810,791 ක්වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේ රු.47,458,572 දක්වා සියයට 5 කින් පහළ ගොස් තිබුණද 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.114,264,804 ක් දක්වා වර්ධනය වී තිබුණි.

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා 01 ක්(Undergraduate), පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් (Postgraduate), උසස් පාඨමාලා 07 ක් (Executive/Higher), ඩිප්ලෝමා පාඨමාලා 10 ක් (Diploma) හා සහතික පත්‍ර පාඨමාලා 22 ක් (Certificate) ලෙස සමස්ත පාඨමාලා 45 ක් පැවතුනි. නමුත් 2017 වර්ෂය වෙනුවෙන් පාඨමාලා 36 ක් සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබූ අතර ඕින් පාඨමාලා 11 ක් සඳහා වසර 05 ක සිටම සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය වන විට පාඨමාලා 45 අතුරින් පාඨමාලා 22 ක් නවතා තිබූ අතර සිසුන් බඳවා ගැනීමට අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි අනුමත කරන තෙක් එම පාඨමාලා කල් දමා ඇති බව විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 3816 කින් අඩු වී තිබූ අතර එය සියයට 52 ක අඩුවීමකි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කළ යුතු කාර්යභාරයන් 54 ක් පැවති අතර වර්ෂය තුළ ඉටු කිරීමට නොහැකි වූ කාර්යයන් 19 ක් පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන අරමුණු 07 ක් යටතේ පරමාර්ථ (Goals) හා උපායමාර්ග (Strategy) ඇතුළත් කරමින් පිළියෙල කර තිබුණද එක් අරමුණක් වෙනුවෙන් උපායමාර්ග සඳහා පමණක් අයවැය ඇස්තමේන්තුව දක්වා තිබුණි. අනෙක් අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තු දක්වා නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කර නොතිබුණු අතර එහි කාර්යයන් ඉටුකළ කාලවකවානු හා වැය කළ මුදල් පිළිබඳ සඳහන්ව නොතිබුණි. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් සැලසුම් කළ කාලවකවානු වල හා ඇස්තමේන්තු වියදම් සීමාව තුළ ඉටුකරන ලද බව තහවුරු කරගැනීමට නොහැකි විය.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 98 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 73 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය. අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාල පුරප්පාඩු සඳහා ස්ථිරව නිලධාරීන් බඳවා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 25 දෙනෙක්ද වැඩ සහයකවරයෙක්ද ලෙස සේවකයින් 26 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 04 දින ඉදිරිපත් කර තිබුණි.

8

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

**6.2 ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1 ඡේදය පරිදි ප්‍රසම්පාදන සැලැස්මෙහි ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබූ අතර සැලැස්මෙහි ඇති වන වෙනස්කම් සමාලෝචනය කර නිතිපතා යාවත්කාලීන කරද නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු.13,635,350 ක් වටිනා භාණ්ඩ, වැඩ හා සේවා 08 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ රු.974,562 ක් වටිනා කාර්යයන් 12 ක් ඉටුකර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.3,444,809 ක මුදලක් වැය කර තිබූ අතර එහි විචලනය සියයට 134 ක් විය.

**6.3 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා සත්‍ය අගයන් සැසඳීමේදී ආදායම් රු.72,363,395 කින් එනම් සියයට 44 කින් විචලනය වී තිබූ අතර වෙනත් මෙහෙයුම් වියදම් රු.45,902,486 කින් එනම් සියයට 94 කින් විචලනය වී තිබුණි.

**6.4 අභ්‍යන්තර විගණනය**

කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණි. 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව 2017 වර්ෂය තුළ ආයතනයේ විෂයයන් 13 ක් විගණනය සඳහා සැලසුම් කර තිබුණද ඉන් විෂයයන් දෙකක් පමණක් විගණනය කර තිබීමෙන් ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටි බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2014 ජූනි 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිතා කරන ලද ආයතනයට අයත් රු.69,900 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරාගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය වරින්වර සමාලෝචනය කර ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා නොගැනීම. |
| (ආ) ආයෝජන කළමනාකරණය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීනව පවත්වා නොගැනීම |

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| (ඇ) වාහන පාලනය | වාහනවල ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂා නොකිරීම, වාහන සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොගැනීම, වාහන සම්බන්ධ සමීක්ෂණ සිදු නොකිරීම, ධාවන් සටහන් සහ ගමන් පිළිබඳ මාසික සාරාංශ වාර්තා වල තොරතුරු ඇතුලත් නොකිරීම. |
| (ඉ) පාඨමාලා පවත්වාගෙන යාම | අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුමත කර නොගෙන පාඨමාලා ආරම්භ කර තිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

11

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (01) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 2.<br>2.1 | මූල්‍ය ප්‍රකාශන තත්වාගණනය කළ මතය | මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | එකඟ වේ. | |
| 2.2<br><br>2.2.1 | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**<br><br>**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති** | **<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02</u>**<br><br>මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇති රු. 316,565 ක තැන්පත් මුදල් ගලාඒම් තුළ රු. 1,838,400 ක් වටිනා පුස්තකාල තැන්පතු අගයද ඇතුළත් කර තිබුණි. එසේ තිබියදී නැවත එම අගය පුස්තකාල තැන්පතු මුදල් ගලා ඒම් ලෙස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගැලපීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ගලා ඒම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රමිත අංක 02ට අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | 2018 වර්ෂයේ සිට ප්‍රමිත අංක 02ට අනුව කටයුතු කර ඇත. |
| 2.2.2 | ගිණුම්කරණ ප්‍රතිපත්ති | පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා ක්‍රමක්ෂය කිරීමට ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර ස්ථාවර වත්කම් යටතේ වාර්ෂිකව සියයට 20 බැගින් ක්ෂය කර තිබුණද ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. කෙසේ වුවද, ක්ෂය උපලේඛනයේ සඳහන් පරිදි වර්ෂයට අදාළ ක්ෂය රු. 252,257 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එම වටිනාකම රු. 448,257 ක් ලෙස දක්වා තිබුණි. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| 2.2.3 | **ගිණුම්කරණ අඩුපාඩු** | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| | | (අ) | ප්‍රාග්ධන ප්‍රදානවලින් ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණේ රු.7,473,859 වුවද වැය නොකළ ප්‍රාග්ධන ගිණුමෙන් වැය කල ප්‍රාග්ධන ගිණුමට බැර කර තිබුණේ රු. 7,607,891 ක් වීමෙන් වැය කල ප්‍රාග්ධන ගිණුම රු. 134,031 කින් වැඩියෙන් දක්වා තිබුණි. | රු.134,032.00 ක් ඉපයූ ආදායම් තුළින් ලී බඩු කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබෙන අතර එය වැරදීමකින් වැය නොකළ ප්‍රාග්ධන ගිණුමෙන් මාරු කර තිබේ. 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙය 2018 වර්ෂයේ ජර්නල් අංක 037 තුළින් නිවැරදි කර ඇත. |
| | | (ආ) | ක්ෂය උපලේඛනය අනුව වාහන සඳහා වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු. 2,949,375 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු. 724,375 ක් ලෙස දක්වා තිබුණි. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | | (ඇ) | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් සඳහා ක්‍රමක්ෂය ගණනය කළ නොහැකි වුවත් ආයතනය විසින් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණිත අගය මත නැවතත් ක්‍රමක්ෂය ගණනය කර තිබුණි. එබැවින් ක්‍රමක්ෂය අගය සහ වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය නිරවද්‍ය නොවීය. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | | (ඈ) | 2017 වර්ෂය වනවිට සම්පූර්ණයෙන් ක්ෂය වී නොමැති වාහන දෙකක් සඳහා ක්‍රමක්ෂය ගිණුම්ගතකර නොතිබුණි. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| | | (ඉ) | 2017 වර්ෂයට අදාළ වූ රු. 1,557,168 ක වියදම් 2018 වර්ෂයේදී ගෙවා තිබුණද මෙම අගය උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂයේ සිට සියළුම උපචිත වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම්කර ඇත. | උපචිත වියදම් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. . |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| **2.3** | | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්** | පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය . | | |
| (අ) | | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**<br>1985 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය සහ 16 වන වගන්තිය සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදලේ 16 වන වගන්තිය | ආයතනයේ සේවයේ යෙදී සිටින සේවකයින් වෙනුවෙන් නියමිත දිනවලදී දායක මුදල් නොගෙවීම හේතුවෙන් මෙම වර්ෂවලට අදාළව සේවකයා විසින් ගෙවිය යුතු සියයට 8 ක දායක මුදල හා අධිභාර ලෙස එකතුව රු. 8,982,751 ක් සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් ගෙවා තිබුණි. | ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව විසින් අදාල සේවකයින්ට සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අදාල දායක මුදල් ගෙවීමට තීරණය කරනු ලැබුවේ 2016 සැප්තැම්බර් මස සිටය. ඒ අනුව සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීමට තීරණය කරන ලදී. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල විසින් කරන ලද පරීක්ෂණයන්ට අනුව දඩ මුදල් ද ගෙවීමට සිදුවිය. වර්තමානයේ මෙම අරමුදල් නිසි වෙලාවට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබේ. | වර්තමානයේ මෙම අරමුදල් නිසි වෙලාවට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබේ. |
| | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | I | මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වර්තමානය වන විට හානි සඳහා ලේඛණයක් ආරම්භ කර ඇත. | මෙම ලේඛනය 2018 වර්ෂයේ සිට නිවැරදිව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| | II | මුදල් රෙගුලාසි 371 සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 179 කදී එකතු වටිනාකම රු. 2,905,666 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. | අත්තිකාරම් ලබාදීම මේ වන විට මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමා කර ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපදාන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 2015/03 ට ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | | අත්තිකාරම් අදාළ කාර්යය කඩිනමින් නිමකොට පියවිය යුතු වුවත් අවස්ථා 24 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. 307,640 ක අත්තිකාරම් පියවීම සඳහා දින 18 සිට දින 170 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | ලබාගත් අත්තිකාරම් වල ඉතිරි මුදල් නිසි පරිදි ගෙවා ඇති නමුත් බිල්පත් නිසි වෙලාවට නොලැබීම, බිල්පතෙහි පවතින යම් යම් අඩුපාඩු නිසා නැවත සකස් කිරීමට සිදුවන බැවින් ඉතාම සුළු අත්තිකාරම් ප්‍රමාණයක් පියවීමට කල් ගත වී තිබේ. පසුගිය වසර වලට සාපේක්ෂව ඉතා හොඳ ප්‍රගතියක් අප ඇති කර ගෙන ඇති අතර එය තව දුරටත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | අත්තිකාරම් පියවීම් මේ වන විට නිවැරදි කාල පරිච්ඡේදය තුළ සිදු වේ. |
| | III | මුදල් රෙගුලාසි 751 හා 757 | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්‍ෂණ වාර්තාවට අනුව රු. 758,762 ක් විටිනා ස්ථාවර වත්කම් භෞතිකව ආයතනය තුළ නොපවතින බවත් ස්ථාවර වත්කම් ලේඛනයෙහි අන්තර්ගත නොවුන නමුත් වටිනාකම හඳුනානොගත් අයිතම 347 ක් භෞතිකව ආයතනය තුල පවතින බවත් නිරීක්‍ෂණය විය. | පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය තුළින් අපහරණය කරන ලද භාණ්ඩ, භාණ්ඩ ලේඛනවලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් මෙම භාණ්ඩ තවදුරටත් ආයතනය තුළ ඇති බව භාණ්ඩ ලේඛන තුළින් සනාථ කරයි. නමුත් භෞතිකව එම භාණ්ඩ අපහරණය කොට ඇත. ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව නොතිබූ, වාර්ෂික සමීක්ෂණය තුළින් හඳුනාගත් අයිතම 347ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | වැරදි නිවැරදි කර භාණ්ඩ ලේඛන සකස් කර ඇත. |
| | IV | මුදල් රෙගුලාසි 756 (2) | වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ කමිටුව සමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද පරිගණක අයිතම සම්බන්ධ සමීක්‍ෂණ වාර්තාව අනුව එක් පුද්ගලයෙකුගේ සහභාගීත්වයෙන් පමණක් සමීක්‍ෂණය සිදු කර තිබුණි. | ඉදිරි වර්ෂයන්වල දී නිවැරදිව මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කරන ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. |

| මූලා ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | V | මුදල් රෙගුලාසි 770 | 2016 සහ 2017 වර්ෂයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකිව ඉවත් කිරීමට නිර්දේශ කරන ලද රු. 2,859,260 ක් වටිනා භාණ්ඩ වර්ග 04 ක් විගණිත දිනය වූ 2018 ජූනි 22 දක්වාම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල භාණ්ඩවලින් 90%ක ප්‍රමාණයක් මේ වන විට ඉවත් කර ඇත. | ඉතිරි 10% ක ප්‍රමාණයක භාණ්ඩ ඉවත් කරමින් පවතී. |
| | (ඈ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව රු.36,786,564 වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ආචාර්යවරුන් දේශන පැවැත්වීම පිළිබඳව දේශන සටහන් කිරීම සිදු කරනු ලබයි. | ආචාර්යවරුන් දේශනවලට පැමිණීම සම්බන්ධව අභ්‍යන්තර වාර්තා පවත්වා ගනී. |
| | (ඈ) | 2004 ජූලි 29 දිනැති පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පැවති රු. 155,451,216 ක ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රු.138,412,500/- කට අදාළ ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය දැනටමත් ලබාගෙන ඇති අතර ඉතිරි තැන්පතු සඳහා ද භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | ඉතිරි තැන්පතු සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| | (ඉ) | 2004 ජනවාරි 26 දිනැති අංක පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා රු.5,572,787 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ආයතනයේ පුස්තකාලය ආයතනයෙන් පරිබාහිරව වෙනත් ස්ථානයක තිබිණි. එය එම ස්ථානයෙන් ඉවත් කොට ආයතනයට ගෙන ඒමට සිදු විය. එවිට ඉඩ පහසුකම් මදි වීම නිසා නොයෙක් දුෂ්කරතා පැවතුණි. පුස්තකාලයේ පැරණි, අබලන් වූ පොත්පත් ඉවත් කිරීම 2017 නොවැම්බර් මස සිට වර්තමානය වන තෙක්ම සිදු වෙමින් පවතින නිසා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට නොහැකි විය. ඉහත කී තත්ත්වයන් ස්ථාවරත්වයට පත් වූ විගස පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | 2018 වර්ෂය සඳහා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කරනු ලබයි. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| 3<br>3.1 | මූල්‍ය සමාලෝචනය<br>මූල්‍ය ප්‍රතිඵල | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 42,996,700 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 61,576,424 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,579,724 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටුප් හා දීමනා වියදම රු. 25,094,713 කින් වැඩි වීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.<br>සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු. 15,174,119 ක අතිරික්තය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු. 42,996,700 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පරිශ්‍රමික, ක්ෂයවීම් සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු. 49,810,791 ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේ රු. 47,458,572 දක්වා සියයට 5 කින් පහළ ගොස් තිබුණද 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 114,264,804 ක් දක්වා වර්ධනය වී තිබුණි. | | එකඟ වේ. | |
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ. | | | |
| 4.1<br>4.1.1 | **කාර්යසාධනය**<br>**ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය** | (අ) | ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා 01 ක් (Undergraduate), පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් (Postgratuate), උසස් පාඨමාලා 07 ක් (Executive/ Higher), ඩිප්ලෝමා පාඨමාලා 10ක් (Diploma) හා සහතික පත්‍ර පාඨමාලා 22ක් (Certificate) ලෙස සමස්ත පාඨමාලා 45ක් පැවතුනි. නමුත් 2017 වර්ෂය වෙනුවෙන් පාඨමාලා 36 ක් සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබූ අතර, මින් පාඨමාලා 11 සඳහා වසර 05ක සිටම සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. | අධ්‍යයන සභාවේ නිර්දේශය මත ඇතැම් පාඨමාලා නතර කරන ලද අතර, තවත් සමහරක් පාඨමාලාවන් සඳහා බඳවා ගැනීම අතුරු ව්‍යවස්ථා (By-Laws) හා රෙගුලාසි (Regulations) නැවත අනුමත කර ගන්නා තෙක් කල් දමන ලදී. | 2018 වර්ෂය තුළදී සිසුන් 4856ක පමණ ප්‍රමාණයක් බඳවා ගෙන ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| | කෙසේ වුවද සමාලෝචිත වර්ෂය වන විට පාඨමාලා 45 අතුරින් පාඨමාලා 22ක් නවතා තිබූ අතර, සිසුන් බඳවා ගැනීමට අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසි අනුමත කරන තෙක් එම පාඨමාලා කල්දමා ඇති බව විගණනය වෙත දන්වා තිබුණි. | තව ද, ආයතනයේ පවතින සම්පත් (ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති කථිකාචාර්යවරු, ආයතනයේ දේශන ශාලාවල ප්‍රමාණවත් බව , ශ්‍රමබලකායට ගැළපෙන උපරිම ලෙස යොදා ගෙන කරගෙන යාහැකි පාඨමාලා සහ ආයතනයට මූල්‍යමය ප්‍රතිලාභ ලැබෙන පමණක් පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කර ඇත. අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුමත කර ගැනීමෙන් පසුව නතර කරනු ලැබූ පාඨමාලාවන් මෙම වසරේ දී ආරම්භ කර ඇත. | |
| | (ආ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 3816 කින් අඩු වී තිබූ අතර, එය සියයට 52 ක අඩු වීමකි. | පශ්චාත් උපාධි, ඩිප්ලෝමා, උසස්/ විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් අතුරු ව්‍යවස්ථා (By-Laws) හා රෙගුලාසි (Regulations) සඳහා අනුමැතිය ලැබෙන තෙක් ඒවාට ලියාපදිංචි වීම අධ්‍යයන සභාවේ දී ගනු ලැබූ තීරණයකට අනුව නතර කර තිබීම මෙයට හේතුව වී ඇත. මීට අමතරව ඉංග්‍රීසි පාඨමාලාවේ දේශන පැවැත්වීමට තර්ස්ටන් විද්‍යාලයේ ඉඩ පහසුකම් නොමැතිවීම ද මීට බලපා ඇත. තව ද, ආයතනයේ පවතින සම්පත් (ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති කථිකාචාර්යවරු, ආයතනයේ දේශන ශාලාවල ප්‍රමාණවත් බව, ශ්‍රමබලකායට ගැළපෙන) උපරිම ලෙස යොදා ගෙන කරගෙන යා හැකි පාඨමාලා සහ ආයතනයට මූල්‍යමය ප්‍රතිලාභ ලැබෙන පාඨමාලා පමණක් පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කර ඇත. | ආයතනය සතු සම්පත් සහ ජාතික අවශ්‍යතාවයන් සලකා බලා සමහර පාඨමාලාවන් නතර කිරීමට හෝ අත්හිටු වීමට කටයුතු යොදා ඇත. |

| මූලා‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| | (ඇ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කළ යුතු කාර්යභාරයන් 54ක් පැවති අතර, වර්ෂය තුළ ඉටු කිරීමට නොහැකි වූ කාර්යන් 19 ක් පැවති බව නිරීක්ෂණය විය. | කාර්යසාධක දර්ශක (Key Performance Indicators) 2018 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. | කාර්යසාධක දර්ශක (Key Performance Indicators) අනුව කටයුතු කරනු ලබයි. |
| | (ඈ) | ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන අරමුණු 7ක් යටතේ පරමාර්ථ (Goals) හා උපාය මාර්ග (Strategy) ඇතුළත් කරමින් පිළියල කර තිබුණද එක් අරමුණක් වෙනුවෙන් උපාය මාර්ග සඳහා පමණක් අයවැය ඇස්තමේන්තුව දක්වා තිබුණි. අනෙක් අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තු දක්වා නොතිබිනි. | ඇතැම් කාර්යයන් සඳහා විශේෂයෙන් මුදල් වැය කිරීමට අවශ්‍ය නොවන අතර, කෙසේ වුවද ඉදිරි අවුරුදු වලදී මේ කෙරෙහි අවධානය යොමු කිරීමට සටහන් කර ගනිමු. | 2018 වර්ෂයේ දී නිවැරදි කර ඇත. |
| | (ඉ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබිණි. | 2018 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම (Human Resource Development Plan) සකස් කර ඇත. | සකස් කර ඇත. |
| | (ඊ) | ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙළ කර නොතිබුණු අතර එහි කාර්යන් ඉටුකළ කාලවකවානු හා වැය කළ මුදල් පිළිබඳ සඳහන්ව නොතිබුණි. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් සැලසුම් කළ කාලවකවානුවල හා ඇස්තමේන්තු වියදම් සීමාව තුළ ඉටුකරන ලද බව තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2018 වර්ෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | අවශ්‍ය පියවර ගෙන ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 4.2 | **කාර්ය මණ්ඩල පරිපාලනය** | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 98 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 73 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය. අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාල පුරප්පාඩු සඳහා ස්ථිරව නිලධාරින් බඳවා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 25 දෙනෙක්ද වැඩ සහයකවරයෙක්ද ලෙස සේවකයින් 26 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | 2017 වර්ෂය තුළදී එක් කථිකාචාර්යවරියක් ද, කළමණාකරන සහකාර නතතුරු සඳහා 11 දෙනෙකු ද, පුස්තකාල තොරතුරු සහායක තනතුර සඳහා දෙදෙනෙක් ද, වැඩ සහායක තනතුරු සඳහා එක් අයකුද, කම්කරු තනතුර සඳහා දෙදෙනෙකු ද සේවයට අනියුක්ත කර ඇත. | කළමණාකරන සහකාර තනතුරු 2ක් සහ පුස්තකාල තොරතුරු සහායක තනතුරු 1ක්, පහළ ශ්‍රේණිවල සිට මෙම ශ්‍රේණිවලට උසස්වීම් ලබන සේවකයන් සඳහා වි.වි.ප්‍ර.කො. චක්‍රලේඛ ප්‍රකාරව වෙන්කර ඇත. තව ද, තොරතුරු තාක්ෂණ නිලධාරින් 6 දෙනෙකු බඳවා ගැනීමට අදාල බඳවා ගැනීමේ පටිපාටිය වි.වි.ප්‍ර.කො. නිකුත් කර නොමැති නිසා සම්පූර්ණ කර නොමැත. පරිගණක උපදේශක, පුස්තකාල සහායක, යන තනතුරු පිරවීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |
| **5.**<br>**5.1** | **තිරසර සංවර්ධනය**<br>**තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම** | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “ 2030න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනක්ම විසින් කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි. | අදාල අංශය මේ වන විට තිරසාර සංවර්ධන අරමුණුවලට අනුකූල වන ආයතනික උපාය මාර්ගික සැලැස්මේ අඩංගු ක්‍රියාකාරකම් සකස් කරමින් පවතින අතර, ආයතනයට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබෙන අතර, 2018 සිට 2022 කාල වකවානුවට අදාල වන්නා වූ ආයතනික සංයුක්ත සැලැස්ම මේ වන විට ප්‍රකාශයට පත්කොට උපයෝජනයට ගනිමින් පවතී. තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සඳහන් අරමුණු අතරින් අංක 4, 5, 8 සහ 16 යන අරමුණු ඍජුවම ආයතනික සංයුක්ත සැලැස්මට අනුකූල වේ. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | ඉදිරිපත් කරන පිළිතුරු | **2018** වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| **6.**<br>**6.1** | **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**<br>**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම** | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 04 දින ඉදිරිපත් කර තිබුණි. | | එකඟ වේ. | 2018 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන අදාල දිනයන්හි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **6.2** | **ප්‍රසම්පාදන** | (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1 ඡේදය පරිදි ප්‍රසම්පාදන සැලැස්මෙහි ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබූ අතර සැලැස්මෙහි ඇති වන වෙනස්කම් සමාලෝචනය කර නිතිපතා යාවත්කාලීන කරද නොතිබුණි. | 2018 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර ඇත. |
| | | (ආ) | ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු. 13,635,350ක් වටිනා භාණ්ඩ, වැඩ හා සේවා 08 ක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ රු. 974,562ක් වටිනා කාර්යයන් 12ක් ඉටුකර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර ඇත. |
| | | (ඇ) | ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.3,444,809ක මුදලක් වැය කර තිබූ අතර එහි විචලනය සියයට 134ක් විය. | මෙම අඩුපාඩු සිදු වී ඇත්තේ 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලැස්ම නිසි ලෙස යාවත්කාලීන කර නොතිබූ බැවින්ය. 2018 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම නිසි ලෙස යාවත්කාලීන කිරීමට අදාල අංශවලට උපදෙස් දී ඇති අතර, ඉහත කී අඩුපාඩු නැවත සිදු නොවීමට වගබලා ගන්නා බව මින් දන්වා සිටිමි. | 2018 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| **6.3** | අයවැය පාලනය | සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය අගයන් සැසඳීමේදී ආදායම රු. 72,363,395කින් එනම් සියයට 44කින් විචලනය වී තිබූ අතර වෙනත් මෙහෙයුම් වියදම රු.45,902,486කින් එනම් සියයට ක් 94 කින් විචලනය වී තිබුණි. | | පසුගිය වර්ෂවල අවසන් කළ පාඨමාලා සඳහා ලද පාඨමාලා අතිරික්තයන් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර අදාල පාඨමාලාවන් පියවා ඇත. | ආදායම් හා වියදම් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| **6.4** | අභ්‍යන්තර විගණනය | කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අභ්‍යන්තර විගණනයද සිදුකර තිබුණි. 2017 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන වැඩ සටහන අනුව වර්ෂය තුළ 2017 ආයතනයේ විෂයයන් 13 ක් විගණනය සඳහා සැලසුම් කර තිබුණද ඉන් විෂයන් දෙකක් පමණක් විගණනය කර තිබීමෙන් ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | | කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකට අනුව, විගණන කමිටු පැවැත්වීම ඇතුළුව අනෙකුත් සියළුම පූර්ව විගණන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයට මානව සම්පත් අභිවර්ධන ආයතනයට අමතරව තවත් ආයතන 07 ක අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට පවතින බැවින් අභ්‍යන්තර විගණන වාර්තා මත පමණක් මෙසේ තක්සේරු කිරීම නිවැරදි නොවන බව දන්වා ඇත. | |
| **6.5** | නොවිසඳී ඇති විගණන ඡේද | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | |
| | | (අ) | ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටි බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි. | විශේෂඥතාවයෙන් යුතු කථිකාචාර්යවරු ආයතනය සතුව නොපවතින බැවින් හා එම පාඨමාලාවෙන් ආයතනයට මූල්‍යමය ප්‍රතිලාභ ලැබීම අවම බැවින් ඒ සඳහා වෙන් කර ඇති සම්පත් වෙනත් පාඨමාලාවන් සඳහා යොදවා ඇති අතර, අතිරික්ත භාණ්ඩ කොළඹ විශ්වවිද්‍යාලය වෙත ප්‍රදානය කර ඇත. | අවසන් කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| | (ආ) | 2014 ජුනි 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිතා කරන ලද ආයතනයට අයත් රු.69,900ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පරිගණකය අස්ථානගත වීම පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීමට ඒක පුද්ගල කමිටුවක් 2015.11.27 දින පත්කරන ලද අතර, එම වාර්තාව ආයතනය වෙත 2017.01.05 දින වන විටත් ලැබී නොතිබුණි. එබැවින් 2017.01.05 දින අදාල වියදම අයකර ගැනීමට ලිපියක් නිකුත් කළ අතර එම ලිපියට 2017.01.10 දී පිළිතුරු ලැබී ඇත. එය සැලකිල්ලට ගෙන නැවත ද්විපුද්ගල කමිටුවක් පත්කරනු ලැබූ අතර, එම කමිටු වාර්ථාව 2018 සැප්තැම්බර් මස 03 වන දින පැවති 399 වන ශාස්ත්‍රීය සභාවට ඉදිරිපත් කරන ලදී. | අදාල පැමිණිල්ල විභාග වෙමින් පවතී. |
| | (ඇ) | ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරාගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර, ඒ පිළිබඳව ගිණුම් සටහනක් මගින් 2019 වර්ෂයේ සිට දැක්වීමට සටහන් කර ගන්නා ලදී. | 2018 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන තුළ ඇතුලත් කරනු ලැබේ. |
| **7.** **පද්ධති හා පාලන** | | | | |
| (අ) අයවැය පාලනය | | අයවැය වරින්වර සමාලෝචනය කර ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා නොගැනීම. | මේ වන විට අදාල නිලධාරින් විසින් අයවැය සමාලෝචනය කර ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගැනීමට ඉදිරි වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ. | |

| මූලා‍්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | (ආ) | ආයෝජන කළමනාකරණය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීම. | මී. 138 ක භාණ්ඩගාර අනුමැතිය ලබාගෙන ඇත. | ඉතිරි තැන්පතු සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| | (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීනව පවත්වා නොගැනීම. | අවශ්‍ය උපදෙස් නිලධාරීන්ට ලබා දී ඇත. | 2018 වර්ෂයේ දී යාවත්කාලීන කර ඇත. |
| | (ඈ) | වාහන පාලනය | වාහනවල ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂා නොකිරීම, වාහන සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වා නොගැනීම, වාහන සම්බන්ධ සමීක්ෂණ සිදු නොකිරීම, ධාවන සටහන් සහ ගමන් පිළිබඳ මාසික සාරාංශ වාර්තාවල තොරතුරු ඇතුලත් නොකිරීම. | වර්තමානය වන විට මෙම අඩුපාඩු අදාල නිලධාරින් විසින් නිවැරදි කර ඇත. | |
| | (ඉ) | පාඨමාලා පවත්වාගෙන යාම | අතුරු ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුමත කර නොගෙන පාඨමාලා ආරම්භ කර තිබීම. | වර්තමානයේ අනුමත කළ පාඨමාලා පමණක් පවත්වාගෙන යනු ලැබේ. | අනුමත පාඨමාලා පමණක් පවත්වා ගෙන යනු ලැබේ. |